


සමන් පිච්ච කුසුම් ගමේ පිපී විසිරිලා
නුඹේ ඇඳුම් ඇඳන් ළමෝ දුවයි ශිල්ප බලා
නැතත් ශිල්ප වරම් එදෙස හොරෙන් ඉඳන් බලා
හිතේ සතුට ඇස්දෙක අග කඳුලින් දිලිසිලා

ගමේ කිලිටි ගලේ ගසා ගසා සෝදලා
නුඹේ සවිය වතුරේ යයි දොලේ සේදිලා
හදේ සුසුම් රුහිරු නහර සම ඇඹිරිලා
නේක වර්ණ සළු අස්සෙන් හැලෙයි මිරිකිලා

කළුවර අහසේ කොටනා විදුලිය පිටවෙලා
නුඹේ හිතේ අකුණක් වී දුවයි සිරුර පුරා
වහින වැස්ස පොල්අතු වහලෙන් හෙමිහිට ගලා
ලිපේ ගිනි නිවා කුස ඇතුලේ ගින්නක් වෙලා

සැදෑවත්තු පෝයදාට පන්සල් පැමිනිලා
සුනීත සෝපාක චරිත අසයි නිහඬ වෙලා
බෝමලුවේ නුඹ දැකලා ඇයි කොනකට වෙලා
නුඹේ කඳුළු බිඳුවෙ පහන් එලිය පතිත වෙලා

අතුල විජේවික්‍රම

## ශ්‍රේෂ්ට මිනිසකු මම ලදිමි

එක් දෙයකි වැස්ස.....
අහස පොලවට
ආදරය කරන බව හඟවන ;
එලස ඔබද සබඳ මට..
ආදරය හඟවන..... එක් දෙයකි....
ඔබෙන් ලබනා... තහාංචි
නිරතුරුවම මට !,
ජීවිතේ..... මුල ඉකිගසා හැඩූ මම
ඒ තහංචි මැද.....,
ආඩම්බර වෙමි.... රට රාජ්‍යක්.....
ලැබූ එකියක ලෙස...
ඒ තහංචි මැද අද...,
සියලු පාප කර්මයින්ගෙන්....
ලොව සිටින,
සියලු පාපකර්ම වලින්...
ලොව තිබෙන...
මා ගලවා ගැනීමට දැරූ උත්සහය
එම තහංචි බව....
මා පසක් කර ගතිමි...,

ඉදිං....
මා ඔබෙන් ලබනා
දැඩි සෙනෙහස එය නොවේද ?
පසක් විය ජීවිතේ....
යෞවුන් හිමිදිරිය නිමාකර...
මැදිවියේ මද්දහන ලැබූ විට...
ඔබවන් ශ්‍රේෂ්ඨ මිනිසෙක්
මා ලද බව..!

## මංගලා ......

බෙරික්

වයලට් ගුණරත්න ගේ උත්පලවන්නා මෑනියෝ කවිය පැහැදිළි නැති හෙයින් එය පැහැදිළිව ලියා නැවත එවන්න

## අද අපි, යන්නේ කොහේ ?

වෙනස් වේ ලෝකය
හැම අතින්ම
පස්සට තල්ලු වී වච් දහම
අඩුවේ පන්සල් යෑම
ගියත් පිළිපදිනවාද
සිල් පහම ?

සොයන්නේ විනෝදයයි
ආලයයි සුවපහසුවයි

අද කියන බණ තර්කානුකූලයි
ගැලපෙයි
නිවන බලාම බණ නොඅසයි නොකියයි
සෝම හිමි මතක් වෙයි

එක අතකින් හරි
දුරදිග බැලුවොත් වැරදි

"ජීවිතං අනියතං මරණං නියත'"
මතකයට ඒ බුදු වදන
ඇයි එතකස් දුක් විඳින්නේ !
සැප විඳින්න, තව පරම්පරාවයි
තියෙන්නේ

ආවෙ නිකං යන්නෙ නිකං
දිරි දේ නව වතට

තර්මානුවන් ලෙස හැසිරේ
රෝමයේ ඉන්න වුන්
ඇයි නවීන ලෝකයට පිටුපාන්නේ ?
තවකෙක් අසයි
උරුමයි පුදුමයි කැරකෙන ලෝකයයි
අසීරුයි ගැලවෙන්න වේදනාවෙන්
මිරිකෙයි,
මිනිසා

පසෙක, "අනිච්චාවත සංඛාරා....
ගිගුරුම් දෙයි

ආචාර්ය මාතු එච්. ලියනගේ

## මගේ සෙනෙහස.....

| | |
|---|---|
| අතට රන්මසු මහැඟි අබරණ මට නැත | අවැසි |
| පයට විල්ලුද ගතට මුදු සේලද නැත | අවැසි |
| හිසට දිව මාළිගා දැසි දැස්සන් නැත | අවැසි |
| හදට නුබේ සෙනෙහස නොඅඩුව ලැබුනාම | ඇති |
| | |
| මනරම් යව්වනයේ නුඹට පිදූ හද ඇත | නොවෙනස්ව |
| කොතරම් කල් ගත වුවද සෙනෙහස අඩු | නොවෙන |
| නුඹේ නමින් දූ පුතු මිණි මුතුවන් | ලැබුන |
| හිමිටනි නුඹ නමටයි පතිවත දිවිහිමියෙන් මම | රකින |
| | |
| ජීවන දිගු ගමනේ සැඳෑ කාලය එළඹෙන තුරු | ඉන්නම් |
| නුඹ අසලම ගැවසෙමින් නුඹ හට දිරියක් | වන්නම් |
| හද පිරි සෙනෙහසින් හිස පිරිමදිමින් උවටැන් | කරමින් |
| නුඹට කලින් මම මෙලොවින් සමු | ගන්නම් |

සුභාෂිනී බුද්ධසිරි

බෙරික්

## පුංචි මිණිපිරිය වෙත

01. සීත සෘතුවේ දවසක
වර්ණ පුෂ්පයන්ගෙන් පිරි
කැමීලියා රුක් සෙවනෙහි
ගත කරමින් සිටියා

02. රෝස පැහැති දෙකපොල
අතරින් ගලනා කීචි බීචි
සුමිහිරි වූ නලා හඬක්
සෙමින් සෙමින් ඇසුනා

03. ඒ සුන්දර මිණිපිරි හඬ
ජීවිතයේ පළමු වරට
සිරි ලංකා දීපයේ සිට
ඥාතීන්ටත් ඇසුණා

04. ඒ හඬ කන් වැකුණු විගස
කිරි අම්මට දුක හිතිලා
පුංචි පැටික්කිය බලන්න
මෙල්බන් වෙත ආවා

05. තෙමසක් දැඩි මහන්සියෙන්
හදා ගත්ත කිරි කැටියත්
උකුලෙ රුවා ගත් තිදෙනා
ලංකාවට ආවා

06 ඔබේ දිවිය සරු කරන්න
දිවා රැයේ නිදි නොලබා
වෙහෙසෙන සැටි දෙමව්පියන්
සැමයිට මතකයට ගන්න

07. අපි ගිය පසු ලක්දිව වෙත
අපිව බලන්නට එන විට
කවරදාක හෝ විගසින්
වරෙන් දුවේ හෙළ සිරිතට

08. බුදු ගුණ මුළු සිත පුරවා
උදේ සවස දෙගුරුන් වැඳ
ලක් දෙරණට ගරු කරමින්
හෙළ දියණියක් වෙයන් දුවේ

09. සබ්බ සකල මනාමය
සොරකම් කල හැක සොරුනට
උගත් ශිල්ප පමණක් ලොව
රැඳෙයි සදාකාලිකවම

10 ලක්දිව දෙරණේ පිහිටී
මී මතු පරපුර සුරැකී
ඉඩම් නිවෙස් විකුණාගෙන
තම මා පිය අමතක කර

11. සුරපුරෙකැයි සිතා මෙරට
සිටිනා අපෙ නොදරුවන්ට
මුනිඳුන්ගේ අනිත්‍ය බව
මෙනෙහි වෙනවා කවර දිනක

12. සිරි කල්දිව ඔබගේ දේශයයි දුවේ
එරන් දෙරන ඔබගේ මව්රටයි පුතේ
දිවිය තිබෙන තුරු එය අගයන්න පුතේ
අපි හැමවිට ඔබ ගැන සිතනවා දුවේ

සුනිල් අබේසේකර
සකුන්තලා සෙනෙවිරත්න
මාර්න්ඩා - මෙල්බන්



## මේ තමයි යාලුවේ - සොබාදමේ චක්කරය

බිත්තියේ දින දසුන - බලයි මැලවුන නෙතින්
නුඹ වෙන්ව යන දිනය - එළඹේවි අද හෙටම
දෙදාහස් එකොලහේ - පුරා වසරක් තුලම
නුඹ නිහඬ සේවයට - නය ගැතිය අපි සැවොම
නොහිටියා නම් නුඹත් - බිත්තියේ එල්ලිලා
කොයි තරම් වැඩ ගොඩක් - කරාවිද අපි අවුල්
දුක තමයි මගෙ හිතේ - ඒත් මක් කරන්නද
මේ තමයි යාළුවේ - සොබා දමේ චක්කරය

අලුත් දින දසුන ඇත
හිනැහෙමින් පුටු මතේ
බිත්තියට පැනගන්න
නොඉවසිල්ලෙන් වගේ
සුරූපී දැරියකගෙ
මුහුණ ඇත සිතුවම්ව
අපූරුයි බලන්නට
මේ අලුත් දින දසුන
පිලිගනිමු නව වසර
හද පිරුණු සංතොසින්
පතන්නෙමි හැමෝටම
නිරෝගී සුව පැතුම්

මාලා කරුණාතිලක

## පහන් වැට



## සිත සනසන ගැයුම් - වැයුම්

| | |
|---|---|
| රසික සිතන - ගීත තාල රසින් පණ | පො වා |
| ගත - සිත සනහන - නලවණ වදන් | හසුරුවා |
| දොම්නස් සිත් සොමනස් වන මිහිර | මව මවා |
| ගායන - වාදන නාදෙන් සිත් | සැන සේවා |
| | |
| සිත් සිලවත් කරවන ගායනා | වාදනා |
| මෙත් - කරුණා දයා සිතුම් මැවී | සුදිලෙනා |
| වින්දන ගී රසය මවයි සිතේ | බාවනා |
| අරමුණු මැවි - මැවී යෙදේ බැතින් | වන්දනා |
| | |
| පාළුව - තනිකම නොදනේ ඇසෙනා තැන ගී | සුමිහිරි |
| කම්පා සිත් නිසල කරයි සාන්තවූ ගී | මුදුපිරි |
| දූවෙන - තැවෙන - සෝක සිතුම් තුරන් කරණ ගී | රසපිරි |
| සුන්දර පැදි අණ පොවමින් සවන් පිනන ගීත | සුපිරි |
| | |
| සිත ඇදෙනා ගීතයකට - කාන්දමක් බලා | ඇති |
| රළු - සිත් මුදු කරවන්නට ඔසුවක් ඇති ගුණ | අති |
| අරමුණකට නතුකරමින් බවුන් වඩන මෙත් | බැති |
| ගීතය සනසාලයි සිත් රිදමෙන් පිරිපුන් | නිති |
| | |
| ලඟ නැති අය ලංකරවන විස්මිත සවි ඇති | මහා |
| ගීතය පූජනීය වේ සිත් සනසන | වහා |
| ගීත - රංග දේ වින්දන පවිටු චේතනා | නහා |
| ගීතයකට ඇත සුන්දර සාන්ත අනුහස් | මහා |

ඇල්ෆ්‍රඩ් වටපළුව